**හාලිඇල ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
**-----------------------------**

1 **මූල්‍ය ප්‍රකාශන**
**---------------**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ඔක්තෝබර් 31 දින වන විටද විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මැයි 13 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 **ගණුදෙනු, මෙහෙයුම් හා කාර්යසාධනය පිළිබඳ අදහස් දැක්වීම**
**-----------------------------------------------------------------**

1.2.1 සේවක ණය
--------------

සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලබා ඇති, සේවය අත්හිටවූ හා මියගිය සේවකයින් / නිලධාරීන් 14 දෙනෙකුගෙන් වසර 04 කට අධික කාලයක සිට අය නොවී පවතින රු.163,253 ක සේවක ණය ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදය 1:6 හා 4 වගන්ති වල විධිවිධාන අනුව අයකර ගෙන නොතිබුණි.

2. **මූල්‍ය සමාලෝචනය**
**---------------------**

2.1 **ආදායම් පරිපාලනය**
**----------------------**

2.1.1 **වරිපනම් බදු**
**---------------**

2013 වර්ෂය ආරම්භයේ පැවති හිඟ වරිපනම් බදු ආදායමෙන් අයකිරීම් ප්‍රතිශතය 37% ක් වූ අතර, වර්ෂය තුල බිල්කල ආදායමෙන් අයකිරීම් ප්‍රතිශතය 36% ක තරම් දුර්වල මට්ටමක පැවතුණි.

2.1.2 ඉඩම් බදුදීම
--------------

හාලිඇල නගරයේ බණ්ඩාරවෙල මාර්ගයට යාබදව පිහිටි රූඩ් 02 යි පර්චස් 6.9 ක් වූ ඉඩම රු.48,000 ක වාර්ෂික බදු මුදලකට දීර්ඝකාලීනව බදු දී තිබුණු අතර තරඟකාරිත්වයට ඉඩදෙමින් විධිමත්ව ටෙන්ඩර් කැඳවා බදු දී නොතිබුණි.

වාර්ෂික බදු මුදල රජයේ තක්සේරුකරු මගින් තක්සේරු කරගැනීමෙන් තොරව සභාව විසින් තීරණය කර තිබුණු අතර අදාල ඉඩමෙන් අක්කර 1/2 ක ප්‍රමාණයක් බදු දීම සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන තිබුණද, බදුකරු සමඟ එළඹී ගිවිසුම අනුව රූඩ් 02 යි පර්චස් 6.9 ක බිම් ප්‍රමාණයක් බදු දී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

3.1 **කොන්ත්‍රාත් පරිපාලනය**
---------------------------

**ඇටම්පිටිය උප කාර්යාලයීය ගොඩනැගිල්ලේ ආයුර්වේදය, මහජන සෞඛ්‍ය පරීක්ෂක කාමරය (PHI) සහ ගබඩා කාමරය සහිත කොටසෙහි වහලය බිත්ති මගින් එසවීමේ කර්මාන්තය**
------------------------------------------------------------------------------------------------

ඇටම්පිටිය උප කාර්යාලයීය ගොඩනැගිල්ලේ අළුත්වැඩියා සඳහා කටුගහ ග්‍රාමීය සමෘද්ධි සංවර්ධන සමිතිය සමඟ 2012 නොවැම්බර් 26 දින රු.315,794 ක ගිවිසුමකට එළඹ 2012 දෙසැම්බර් 04 දින රු.63,158 අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත්තුව ඉටුකරන ලද ප්‍රජාපාදක සංවිධානය තෝරාගැනීම සම්බන්ධයෙන් 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3:1 ඡේදය පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානියා හා ප්‍රාදේශීය ලේකම් නම් කරන නියෝජිතයන් දෙදෙනෙකුගෙන් සමන්විත ත්‍රිපුද්ගල කමිටුවක නිර්දේශය ලබාගෙන නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 3:2 ඡේදය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධානයේ සුදුසුකම් පරීක්ෂා කර නොතිබුණි.

(ඇ) අළුත්වැඩියා කළ යුතු කොටසෙහි වහලය ගලවා ඉවත් කිරීමෙන් පසු ඇස්තමේන්තුගත වැඩ කොටස් කලට වේලාවට ඉටු නොකිරීමෙන් වූ නොසැලකිල්ල මත ගොඩනැගිල්ල තුලට වර්ෂා ජලය එක් රැස් වීමෙන් බිත්ති කඩා වැටී තිබු බවද, කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු මුළුමනින්ම අත්හැර දමා තිබු බවද, 2014 ජනවාරි 23 දින සභාවේ කාර්මික නිලධාරිවරිය සමඟ කර්මාන්තය සම්බන්ධයෙන් කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(ඈ) මෙම කර්මාන්තය සඳහා ඇටම්පිටිය උප කාර්යාලීය ගොඩනැගිල්ලෙහි ගලවා ඉවත් කරන ලද සෙවිලි ද්‍රව්‍යය, පරාල, රීප්ප, දොරවල්, ජනෙල් උළුවහු ආදිය භෞතිකව පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් නොකළ අතර එම ද්‍රව්‍ය ලේඛණගත කර නොතිබුණි.

3.2 **නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්**
--------------------------------------

(අ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයෙන් පරිත්‍යාගයක් ලෙස ලැබී තිබුණු අංක JZC 350 දරන විශාල ප්‍රමාණයේ කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය

(ආ) අත්ට්‍රැක්ටරය (V 9055257 / WV 90028884)